බුදුරජාණන් වහන්සේ වෘක්ෂ ආරක්ෂා කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අවධානය යොමුකර ඇත්තේ එය තම කෙලෙස් ප්‍රහීන කිරීමේ අපේක්ෂාවන් හා සම්බන්ධ කරමිනි.

*"මහණෙනි, කෙලෙස් වනය සිඳුව රුක් නොසිඳුව"*

කෙලෙස් වනාන්තරයකට උපමා කර, එය සිඳීමට වෙර වීරිය දරන ලෙසටත්, එහෙත් වෘක්ෂයන් සිඳලීමට කටයුතු නොකරන ලෙසටත්, උන්වහන්සේ විසින් දේශනා කරන ලද්දේ පරිසර පද්ධතියේ පැවැත්මට ගහ කොළෙන් ලැබෙන දායකත්වය වටහා දෙමිනි.

පරිසරයට පවා ප්‍රතිඋපකාර දැක්වීම යහපත් ක්‍රියාවක් බව දේශනා කළ බුදුරජාණන් වහන්සේ යමෙකු තමනට සෙවණ දුන් ගසක අත්තක් කඩා දමන්නේ නම් හෙතෙම අධම මිත්‍රද්‍රෝහී අයෙකු වන බව වදාල සේක.

*"යස්ස රුක්ඛස්ස ඡායාය - නිසීයෙය සයෙයවා*
*තස්ස සාඛංභඤ්ජෙයය - මිත්ත දුභෝහි පාපකෝ"*

බුදුබව ලැබීමෙන් අනතුරු ව තමනට සෙවණ දුන් ඇසතු බෝ රුක දෙස නෙත් පිය නොසලා සත් දිනක් අනිමිස ලෝචනකර උන් වහන්සේ තමන් විසින් ම ප්‍රතිඋපකාරයේ වටිනාකම ලොවට පසක් කරන ලදී.

## පරිසරය උදෙසා පැනවූ විනය නීති

භික්ෂූන් වහන්සේ වෙත පැනවූ විනය නීති තුළ පරිසරය දූෂණය වීමට හේතු සාධක වන ක්‍රියාවන්ගෙන් වැළකීමට නීති පනවා ඇත.

වර්තමානයේ සමස්ත ලෝකයේ ම අවධානයට පත්වන ජල දූෂණය, ශබ්ද දූෂණය, පස දූෂණය ආදිය වැළැක්වීම සඳහා එදා භික්ෂූන් වහන්සේලාට පැනවූ විනය නීති ඉතා සරල ඒවා ය. එහෙත් එය සමස්ත ජීවයේ ම පැවැත්ම උදෙසා මහා කරුණාවෙන් පැනවූ නීති බව ලොවට පසක් වී අවසන් ය.

ජීවයේ පැවැත්මට ජලයේ ඇති වැදගත්කම බුදු දහමේ කැපීපෙනෙන අතර, එහි දී භික්ෂූන් වහන්සේ ජලයට කෙළ ගැසීම, ජලයට මළ මූත්‍ර පහකිරීම නොකළයුතු බවත්, කුණු රොඩු ආදිය ජලයට නොදැමිය යුතු බවත්, විනය නීති ලෙස පනවා ඇත.

උස් හඬින් කතා කිරීම, ශබ්ද කිරීම, ඝෝෂා කිරීම නුසුදුසු බව බුදුරජාණන් වහන්සේ දේශනාකර ඇත්තේ ශබ්ද දූෂණයට සියලු සත්ත්වයන් අසතුටු බව වටහා දෙමිනි.

**පස දූෂණයවීම වැළැක්වීම සඳහා පැනවූ විනය නීති අතර,**

- භාවිතයටගත් දැහැටි දඬු තැන තැන නොදැමිය යුතු ය.
- කුණු කසල තැන තන නොදැමිය යුතු ය.
- මළ මූත්‍ර තැන තැන බැහැර නොකළ යුතු ය.
- කෙළ ගැසීම ආදිය තැන තැන නොකළ යුතු ය.

ශාක සංරක්ෂණය පිළිබඳ ව කරුණු මිහින්තලය පුවරු ලිපිවල සඳහන් වන අතර, එහි දී එම විහාර භූමියට අයිති ප්‍රදේශයේ මී, තල්, පොල්, සියඹලා, ආදී ශාක කපා දැමීම තහනම් කර ඇත.


BDS
BIODIVERSITY SECRETARIAT

අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව)
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයය
අංක 980/4, වික්‍රමසිංහ පෙදෙස,
ඇතුල්කෝට්ටේ



-සැකසුම-
ටී.එම්. අනුරුද්ධ තෙන්නකෝන්
පරිසර කළමනාකරන නිලධාරි


Design | Chamin Wijesinha 0777 577299



# බුදු දහමයි පරිසරයයි

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර අමාත්‍යාංශය



# බුදු දහමයි පරිසරයයි

ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ දැකිය හැකි ප්‍රධානතම ලක්ෂණයක් වන්නේ සාමාන්‍ය ජන ජීවිතය හා පරිසරය අතර පවතින සෘජු සබඳතාවයයි. පරිසරය ට හානි නොවන ආකාරයට තම අවශ්‍යතා සපුරාගනිමින් ගහකොළ හා සත්‍ය සීපාවාගේ පැවැත්ම තහවුරු කරන පරිදි පරිසරය භාවිතයට ගැනීම අප සමාජයේ සම්මත වූ ක්‍රමවේදයකි.

## පරිසර සංරක්ෂණයේ පණිවිඩය ලෝකයට ම

බුදු දහමත් සමග ම පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්පයන් පුළුල් වූ අතර, විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පරිසරය තිරසාර ව යොදාගැනීම ද පුළුල් විය. ඒ සමග ම පරිසර සංරක්‍ෂණය පිළිබඳ අවධානය ද යොමු වූ අතර එමගින් මුළු ලොවට ම සංරක්ෂණයේ පණිවිඩය ව්‍යාප්ත විය. ජීවී විශේෂ සංරක්‍ෂණය සඳහා අභයභූමි හා උද්‍යාන පිහිටුවීම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ කැපී පෙනෙන ලක්‍ෂණයකි.

**මිහින්තලය (මිගදාය)** - **ලේඛනගත ඉතිහාසයක් ඇති ඉපැරණි අභය භූමියයි.**

**නාමල් උයන** - **මිනිස් අභය භූමියයි.**

**මහ මෙවුනාව** - **ඉපැරණි රාජකීය ආගමික උද්‍යානයයි.**



**මිහින්තලය (මිගදාය)**

ආරාම ඉදිකිරීමේ දී ඒවායේ උයන් සඳහා විවිධ ශාක විශේෂයන් යොදාගන්නා ලදී. ඒ අනුව,

### ඵලාරාම

ඵලතුරු වශයෙන් යොදාගන්නා ශාක ආරාම ආශ්‍රිත උයන්වල රෝපණය කර ඵලාරාම ද,

### පුෂ්පාරාම

සුගන්ධවත් හා වර්ණවත් පුෂ්පයන් ආරාම ආශ්‍රිත උයන්වල රෝපණය කර පුෂ්පාරාම ද,

### ඖෂධාරාම

ඖෂධීය ශාක ආරාම ආශ්‍රිත උයන්වල රෝපණයකර ඖෂධාරාම ද නිර්මාණය කරන ලදී.

පරිසරය සුරැකීම නිරන්තරයෙන් කුසල් වැඩෙන පුණ්‍ය කර්මයක් වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

*ආරම රෝපා වන රෝපා*
*යේජනා සේතු කාරකා*
*පපංච උදපානංච*
*යෙදදංති උපස්සනං*

*තෙසං දිවාච රත්තෝච*
*සදා පුඤ්ඤං පවඩ්ඩති*
*ධම්මට්ඨා සීල සම්පන්නා*
*යේ දදන්ති උපස්සනං*



(සංයුක්ත නිකාය, සගාථවග්ග වනරෝප සූක්ත)

යම් පුද්ගලයන් පුෂ්පාරාම, ඵලාරාම රෝපණය කරන්නෝද ස්වභාවික වනයේ චෛත්‍යාදිය ඉදිකිරීමෙන් හෝ සෙවණ පිණිස ගස් වැවීමෙන් උයන් කරන්නෝ ද, ගමනාගමනය සඳහා ඒදඬු පාලම් ආදිය ඉදිකරන්නෝ ද යන එන මගෙහි ජනයාට හා වන සතුනට පිපාසයට බීම සඳහා යම් කෙනෙක් පැන්තාලි පොකුණු හෝ තටාක



ආදිය ද සේනාසන, වාසසර කර දෙන්නම්, ඔවුන් එය දිවා රෑ දෙකෙහි ම සිහිපත්කරන සෑම මොහොතක ම නිරතුරු ව පිං වැඩේ.

බුදුරජාණන් වහන්සේ වනාන්තරය පිළිබඳ ව ද ජනතාවගේ සිත් සතන් අවදි කිරීමට වනාන්තරයේ ඇති පරිත්‍යාගශීලීත්වය ම සිය දේශනා සඳහා යොදා ගත් සේක.

වනාන්තර වූ කලී, සිය පැවැත්ම උදෙසා ඉල්ලීම් නොකරන්නාවූ ද, ජීව ක්‍රියාවලියේ දී සිය නිෂ්පාදිතයන් පරිත්‍යාගශීලී ලෙස ප්‍රදානය කරන්නාවූ ද අපිරිමිත දයානුකම්පාවකින් හා පරිත්‍යාගශීලී භාවයකින් යුතු අපූර්වතම නිර්මාණයකි. සකල ජීවීන් හට රක්ෂාවරණය සලසන්නා වූ එය පොරොව පහරින් සිය විනාශය සලසන්නාට පවා සෙවණ දෙයි.

